ඒකාබද්ධ සේවා චක්‍රලේඛ : 05/2018

මගේ අංක : CS/DOS/21/01/05
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2018.09.10

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන් / ප්‍රාදේශීය ලේකම්වරුන් සහ
ආයතන ප්‍රධානීන් වෙත

**<u>සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කරන ලද නිලධාරීන්ගේ ශ්‍රේණිගත උසස්වීම් ගැටළු නිරාකරණය කිරීම</u>**

අංක 1774/31 දරන හා 2012.09.07 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් සංශෝධිත අංක 1745/11 දරන හා 2012.02.14 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් පළකරන ලද සංවර්ධන නිලධාරි සේවා ව්‍යවස්ථාවේ 14(ii) (අ) වගන්තිය අනුව MN 4 -2006 (ඒ) වැටුප් පරිමාණය යටතේ III ශ්‍රේණියට අදාළ වැටුප් නියම කර ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු දහයකට (10) නොඅඩු එහෙත් අවුරුදු විස්සකට (20) අඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම එහි සඳහන් අනෙකුත් අවශ්‍යතා සපුරා ඇති නිලධරයන් 2011.08.01 දින සිට සංවර්ධන නිලධාරී සේවයේ II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරන ලදී.

02. එම නිලධාරීන් වසර 10කට අධික සේවා කාලයක් සම්පූර්ණ කර තිබුනු නමුත් විවිධ කරුණු හේතුවෙන් 2011.08.01 දක්වාම III ශ්‍රේණියේ තනතුරක සේවය කිරීමට සිදුවීමෙන් ඔවුන්ට අගතියක් වී ඇති බවට ඉදිරිපත් වූ කරුණු සලකා බලා මෙම නිලධාරීන් සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි කටයුතු කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් දන්වා ඇත.

1. සියළුම නිලධාරීන් සේවා ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධාන ප්‍රකාරව සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කිරීම.

2. අන්තර්ග්‍රහණය කරන ලද දිනට වසර 10කට වඩා වැඩි සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන්ගේ එකී වසර 10ට වඩා වැඩියෙන් වන සේවා කාලය ඊළඟ උසස්වීම (එනම් 1 ශ්‍රේණිය) සඳහා සේවා කාලය ගණනය කිරීමේදී භාවිතා කිරීම.

කේ.වී.පී.එම්.ජේ.ගමගේ
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්